# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1986 අංක 35 දරන කුළුගම්මන රජමහා විහාර දායක සභාව (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1986 ඔක්තෝබර් මස 08 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1986 ඔක්තෝබර් මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ ශත : 60 යි

තැපැල් ගාස්තුව ශත : 75 යි.

## 1986 අංක 35 දරණ කුළුගම්මන රජමහා විහාර දායක සභාව (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1986 ඔක්තෝබර් මස 08 වන දින]

එල්. ඩී—ඕ. 28/85.

**කුළුගම්මන රජමහා විහාර දායක සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.** පූර්විකාව.

"කුළුගම්මන රජමහා විහාර දායක සභාව" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී සංගමයට සම්බන්ධ සියළු කරුණු සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කර ගෙන යාමේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද:

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහාද එම පරමාර්ථ හා කරුණු එකී සංගමය විසින් මේ දක්වා සාර්ථක ලෙස ක්‍රියාත්මක කර ගෙන ගොස් ඇති බැවින් සහ ඒ සංගමය සංස්ථාගත කිරීමට ඉල්ලුම් කර ඇති හෙයින්ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1986 අංක 35 දරන කුළුගම්මන රජමහා විහාර දායක සභාව (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කෙරෙන කුළුගම්මන රජමහා විහාර දායක සභාවේ දැනට සාමාජිකයන්ව සිටින නැතහොත් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කර ගනු ලබන සාමාජිකයන් මේ පනත ආරම්භවන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "කුළුගම්මන රජමහා විහාර දායක සභාව" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් බවට පත් විය යුතු අතර, එනමින් සියළුම අධිකරණවල එය විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. තවද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ, පාවිච්චි කිරීමේ හා සංස්ථාවේ අභිමතය පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලතල හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. කුළුගම්මන රජමහා විහාර දායක සභාව සංස්ථාගත කිරීම.

3. සංස්ථාව සංස්ථාපනය කරනුයේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) යහපත් චේතනා වැඩි දියුණු කිරීමෙන් පුණ්‍ය ක්‍රියාවල නිරත වීම හා ඒ ක්‍රියාවල නිරතවීම සාමුහික වශයෙන් කිරීමේ පුරුද්ද ඇති කර ගැනීමට ධෛර්ය දීම;

(ආ) විහාරයේ ඓතිහාසික අගයට හෝ එහි ඓතිහාසික නිර්මාණවලට හානියක් සිදු නොවන සේ විහාරය සංවර්ධනය කිරීම හා පවත්වා ගෙන යාම;

(ඇ) ඒ විහාරයෙහි වසන භික්ෂූන් වහන්සේලාගේ ගෞරවය වැඩි කරලීම පිණිස පියවර ගැනීම හා ඒ විහාරයට අයත් චංචල හා නිශ්චල දේපළ ආරක්ෂා කිරීමට වගබලා ගැනීම; සහ

ඒ—083285—7200(85/04)

(ඇ) සාබදව ඇති විහාර බිම්වල වෙසෙන භික්ෂූන්ට ආගමානුකූලව ජීවිතයක් ගත කිරීමෙහිලා උපකාරීවීමට හිත කර වූ පරිසරයක් ඇති කිරීම පිණිස පියවර ගැනීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යෑමේ සහ වැසීමේ ද අ ප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදානයන් හා පරිත්‍යාගයන් ලබා ගැනීමේ ද සංස්ථාවේ අරමුදල ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සේවක මණ්ඩලය සේවයට ගැනීමේ, සේවයේ නියුක්ත කර ගැනීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ එම පරමාර්ථ අතුරින් යම් කිසිවක් හෝ වැඩි දියුණු කිරීමේ හෝ සංවර්ධනයේ කාර්ය සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය කවර ආකාරයේ වුවද සියලු ක්‍රියා මාර්ග ගැනීමේ සියලු කරුණු ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

විධා. සභාව.

5. (1) සංස්ථාවේ තත් කාලයෙහි වලංගුව පවත්නා රීතිවලට අනුකූලව තෝරාපත් කර ගනු ලබන තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත කෘත්‍යාධිකාරී සභාවක් විසින් සංස්ථාවේ කටයුතු සංස්ථාවේ තත් කාලයෙහි බලපවත්වන්නා වූ රීතිවලට යටත්ව පරිපාලනය කළ යුතු ය.

(2) මෙම පනත ක්‍රියාත්මක වන දිනයේ සංගමයේ කෘත්‍යාධිකාරී සභාවේ නිල දැරූ මහා සභාවේ සාමාජිකයන් සංස්ථාවේ ප්‍රථම කෘත්‍යාධිකාරී සභාවේ සාමාජිකයන් විය යුතු ය.

භාරකාර මණ්ඩලය.

6. ක්‍රම සම්පාදනය හා මුදල් සම්බන්ධ කරුණු පිළිබඳව සංස්ථාවට උපදෙස් දීමේ කාර්යය සඳහා සංස්ථාවේ වලංගුව පවත්නා රීතිවලින් නිශ්චය කොට ඇති තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත භාරකාර මණ්ඩලයක් පිහිටුවිය යුතුය.

සංස්ථාවේ රීති.

7. (1) සාමාජිකයින් ඇතුළත් කර ගැනීම, අස්වීම හෝ නෙරපීම සඳහා ද කෘත්‍යාධිකාරී සභාවේ සහ සංස්ථාවේ නොයෙකුත් නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ හෝ සේවකයන්ගේ කාර්ය විධිමත් කිරීම සඳහා ද, සංස්ථාවේ කටයුතු කිරීමේ දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය හා සංස්ථාවේ කටයුතු පිළිබඳව සාමාන්‍ය කළමනාකාරත්වය සඳහා මෙන්ම එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා ද සංස්ථාව විසින් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සාමාජිකයින්ගේ යම් මහා සභා රැස්වීමක දී බහුතර ඡන්දයකින් කලින් කල සෑදීම නීත්‍යනුකූල විය යුතු ය. එසේ සාදන ලද රීති (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව එවැනිම රැස්වීමකදී වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි ය.

(2) තත්කාලයෙහි සංස්ථාවේ වලංගුව පවත්නා කිසිම රීතියක් හෝ මින්මතු සාදනු ලබන යම් රීතියක්, සංස්ථාවේ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයින්ගෙන් තුනෙන් දෙකක ඡන්දයෙන් හැර වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම නොකළ යුතුය :

එසේ වුවද ඒ වෙනස් කිරීම, එකතු කිරීම, සංශෝධනය කිරීම, හෝ පරිච්ඡින්න කිරීම කෘත්‍යාධිකාරී සභාව විසින් කලින් අනුමත කරනු ලැබ තිබිය යුතු ය.

(3) මේ පනත ක්‍රියාත්මක වන විට බලපවත්නා සංගමයේ රීති මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට මේ වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීති ලෙස සැලකිය යුතු ය.

(4) සංස්ථාවේ සියලුම සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංගමය විසින් ගෙවිය යුතු ණය හා සංගමයට ලැබිය යුතු ණය.

8. මෙම පනතේ කාර්යයන් සඳහා පනත ක්‍රියාත්මක වන විට සංගමයේ පවත්නා සියලුම ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර සංගමයට අය විය යුතු සියලු ණය, සහභාග මුදල් සහ දායක මුදල්, සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

9. කාර්‍යාධිකාරී සභාවේ සාමාජිකයින් දෙදෙනෙකු ඉදිරිපිට දී හැර කවරාකාර වූ හෝ සාධන පත්‍රයකට සංස්ථාවේ මුද්‍රාව නොතැබිය යුතු ය. ඒ සාමාජිකයන් දෙදෙනා පැමිණ සිටි බවට ලකුණු වශයෙන් එම සාධන පත්‍රයෙහි ඔවුන් විසින් ස්වකීය නම් අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම යළි තැනැත්තෙකු සාක්ෂි කරුවෙකු ලෙස අත්සන් කිරීමෙන් පිටස්තරව විය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපල දැරිය හැකි බව.

10. මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු නියාදනයකින් හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාව වෙත පැවරුණු යම් නිශ්චල හෝ චංචල දේපළක් භාර ගැනීමට සහ දැරීමට සංස්ථාවට නීතියෙන් බලය ඇති අතර, එවැනි සියලු දේපළ මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවේ එවකට බලපවත්නා රීතිවලට යටත්ව, උකස් කිරීමේ, විකිණීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ අන් ආකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය සහිතව සංස්ථාව විසින් දැරිය යුතු ය.

ණය ගැනීමේ බලතල.

11. ස්වකීය පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා සංස්ථාව විසින් මුදල් සපයා ගැනීමත් ඒ කාර්ය සඳහා යම් උගස් කිරීම් බැඳුම්කර හෝ බැඳීම් ඇති කර ගැනීම, ලියා අත්සන් කිරීම, ප්‍රදානය කිරීම හෝ නිකුත් කිරීමත් නීත්‍යානුකූල විය යුතු ය :

එසේ වුවද සංස්ථාව විසින් එලෙසින් සපයා ගත හැකි මුදල් ප්‍රමාණවල සමස්තය හෝ තත් කාර්යය සඳහා කාර්‍යාධිකාරී සභාව විසින් නිර්ණය කරනු ලබන මුදල් ප්‍රමාණය නොඉක්මවිය යුතු ය.

ප්‍රති පූරණය කිරීම.

12. සංස්ථාව වෙනුවෙන් සහ එහි යහපත උදෙසා සංස්ථාවේ යම් නිලධරයකු, නියෝජිතයකු හෝ සේවකයකු විසින් සද්භාවයෙන් කරන ලද ගෙවීම් ප්‍රමාණයම සංස්ථාවේ එකී සාමාජිකයාට, නිලධරයාට, නියෝජිතයාට හෝ සේවකයාට, සංස්ථාව විසින් ප්‍රතිපූරණය කරනු ලැබිය හැකි ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

13. මෙම පනතෙහි සඳහන් තැනැත්තන් සහ ඔවුන් මගින් ඔවුන් කෙරෙන් නොහොත් ඔවුන් යටතේ හිමිකම් පාන්නන් හැර, ජනරජයේ, යම් රාජ්‍ය මණ්ඩලයක, බලයලත් සංස්ථාවක හෝ වෙනයම් තැනැත්තකුගේ අයිතිවාසිකම් වලට මේ පනතේ අඩංගු කිසිවකින් හානියක් හෝ බල පෑමක් නොවිය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නම් වර්ෂයක දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.